# ලංසු ආරාධනයයි.( IFB )
# ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
# දැල් වර්ග මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමයි.

ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා දැල් වර්ග මිලදී ගැනීම සම්බන්ධයෙන් සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීමට අදාලව මවිසින් සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අ. අ | විස්තරය | ප්‍රමාණය | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ වටිනාකම | ආපසු නොගෙවන ලංසු සුරක්ෂණ වටිනාකම |
|---|---|---|---|---|
| 01 | කෘමි ප්‍රතිරෝධී දැල් | වර්ග මීටර් 58050 | 124,000.00 | 3,500.00 |
| 02 | සෙවණ දැල් | වර්ග මීටර් 27000 | | |
| 03 | නිල් දැල් | වර්ග මීටර් 19125 | | |

01. මේ සඳහා උනන්දුවක් දක්වන, සුදුසුකම් ලත් ලංසුකරුවන්/නියෝජිතයින් හෝ නම් කළ නියෝජිතයින් සඳහා **2026.09.25** දින සිට **2026.10.11** දින දක්වා රාජකාරි දිනයන්හි පෙ:ව: 9.00 සිට ප:ව: 3.00 දක්වා ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක්, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් හා එක් එක් බාණ්ඩ වලට අදාලව ආපසු ගෙවනු නොලබන ගාස්තුව මහජන බැංකුව බදුල්ල මුතියංගණ ශාඛාවේ ගිණුම් අංක 010-1-001-3-2548254 දරණ ගිණුමට බැරකර ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලංසුපත් ලබා ගත හැකිය. අවශ්‍ය සුදුසුකම් ලංසු ලේඛනයේ සඳහන් කර ඇති අතර ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැමිණ අදාල ලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැක.

02. පිටපත් දෙකකින් යුතු ලංසු ලේඛන **2026.10.12** වෙනි දින **පෙ: ව: 10.30**ට පෙර ලැබෙන සේ "ප්‍රසම්පාදන කමිටුව, ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, රත්වත්ත මාවත, බදුල්ල."ලිපිනය වෙත ඉදිරිපත් කිරීමට හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කෙරේ.

03. **2026.10.12** වෙනි දින **පෙ:ව: 10.30** ට ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදි ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරේ.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කාර්යාල වේලාව තුළදී ලබා ගත හැකිය. දුරකථන අංක - 055-2222318 (පොදු)

05. මේ සම්බන්ධව පූර්ව ලංසු රැස්වීමක් (Pre Bid Meeting) 2026.10.05 දින පෙ.ව 10.30 ට ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදි පැවැත්වේ.

සභාපති ,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
රත්වත්ත මාවත,
බදුල්ල.